# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

5 වසර /Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**ඉතිහාසය**
**History**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලටමත්, II වන කොටසින් 07 වන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න .**

### I. කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

i අතීතයේ ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා **භාවිත කළ නම්** හතරක් ලියන්න.

ii මිහිඳු මා හිමියන්ගේ මවගේ හා නැගණියගේ **නම් පිළිවෙළින්** සඳහන් කරන්න.

iii කෝට්ටේ රාජ්‍යයේ උරුමය පෘතුගාලයේ රජු වෙත **තෑගි ඔප්පුවකින්** පැවරුවේ කවරෙක් ද?

iv අනුරාධපුර යුගයේ මහාවිහාරයට **අභියෝගාත්මක ව ක්‍රියා කළ භික්ෂු** නිකාය දෙක නම් කරන්න.

v අනුරාධපුර රාජධානියට එල්ල වූ **පළමුවන විදේශීය** ආක්‍රමණය සිදුවන විට මෙරට **පාලකයා** වූයේ කවුද?

vi ආර්ය සංක්‍රමණිකයන් විසින් මල්වතු ඔය හා කලා ඔය ආශ්‍රිත ව පිහිටුවා ගත් **ජනපද දෙකක්** නම් කරන්න.

vii (අ) ලංකාවේ **වෙසක් උත්සවය** ආරම්භ කළ **රජතුමා** කවුද?

(ආ) භික්ෂූන් වහන්සේලා උදෙසා **පෞද්ගලිකව ගම්බිම් පිදීම** ආරම්භ කළ රජතුමා නම් කරන්න.

viii (අ) මහාවිහාරය විනාශකිරීම සඳහා **මහසෙන් රජු** පෙළඹ වූ **භික්ෂුව** කවුද ?

(ආ) **ක්‍රි.ව. 5 වෙනි** සියවසේ දී පමණ සීහල අට්ඨකතා ආශ්‍රයෙන් **පාලි අට්ඨකතා** ලිවීමට මූලිකත්වය දැරුවේ කවුද?

ix (අ) පෘතුගීසීන් විසින් යාපනය යටත් කරගත් කාලයේ දී එහි **සිටි පාලකයා** නම් කරන්න.

(ආ) කෝට්ටේ බලකොටුවක් තනා යාපනයේ ආර්ය චක්‍රවර්තිගේ බලයට **විරුද්ධ ව** සටන් මෙහෙය වූයේ කවුද?

x (අ) **ක්‍රි.පූ. 4** වෙනි සියවසේ දී පමණ මෙරට රචනා කරන ලද **පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය** නම් කරන්න.

(ආ) අතීතය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර බෙදෙන **ප්‍රධාන කොටස් දෙක** නම් කරන්න.

(ලකුණු 4 x 10 = 40යි)

### II. කොටස

02. i මල්වතු ඔය, දැදුරු ඔය, ගල් ඔය හා මහවැලි ගඟ හැඳින්වූ **පැරණි නම්** ලියා දක්වන්න.

ii ''අතීතයේ **විදේශීය සම්බන්ධතා වර්ධනය** කරගැනීමට ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම ඉවහල් විය'' සාධක දෙකක් ඇසුරින් පහදන්න.

iii අනුරාධපුර රාජධානිය බිහිවීම හා වර්ධනය සඳහා බල පෑ **භූගෝලීය** සාධක විස්තර කරන්න.

(ලකුණු 04 + 05 + 06 = 15යි)

03. i **සේරුවාවිල දාගැබ, ජේතවන දාගැබ, අම්බස්ථල දාගැබ හා මිරිසවැටි දාගැබ** ඉදිකළ රජවරු නම් කරන්න.

ii අනුරාධපුර යුගයෙහි **ආර්ථික සංවර්ධනය** කෙරෙහි **වාරි කර්මාන්තයෙහි බලපෑම** පෙන්වා දෙන්න.

iii ''අනුරාධපුරයෙහි **අධ්‍යාපනය දියුණු** මට්ටමක පැවතුණි.'' සහේතුකව විස්තර කරන්න.

(ලකුණු 04 + 05 + 06 = 15යි)

04. i මහා විජයබාහු රජු සිදු කළ සේවාවන් **හතරක්** නම් කරන්න.

ii මහා පරාක්‍රමබාහු රජතුමාගේ සේවය **ආගමික හා දේශපාලන** වශයෙන් වැදගත්වන ආකාරය විස්තර කරන්න.

iii පොළොන්නරු යුගයේ **සාමාජයීය හා සංස්කෘතික**, පසුබිම නිර්මාණය වීමට **හින්දු දහමෙන් සිදු වූ බලපෑම** නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 + 05 + 06 = 15යි)

05. i පැරණි රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ **ශෙනපති, මහමත, බඩගරික හා අමත** යන නිලධාරීන්ට පැවරුණ කාර්යභාරය නම් කරන්න.

ii මහසෙන් රජදවස ලංකාවේ පැවති **ආගමික** හා **ආර්ථික** ස්වරූපය නිදසුන් මගින් විමසන්න.

iii අනුරපුර රාජධානිය **පිරිහීමට** බල පෑ හේතු කවරේද යි විස්තර කරන්න.

(ලකුණු 04 + 05 + 06 = 15යි)

06. පහත සඳහන් මාතෘකා අතරින් **03ක්** පිළිබඳ **විස්තර** කරන්න.

i සීගිරිය

ii මහාවංසය

iii සඳකඩපහණ

iv හයවන පරාක්‍රමබාහු රජතුමා

v පොළොන්නරු යුගයේ පරිහාණිය

iv දඹදෙණි යුගයේ සාහිත්‍ය ප්‍රබෝධය

(ලකුණු 05 x 03 = 15යි)

07. i ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි පහත **සඳහන් ස්ථාන ලකුණු කොට** නම් කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (අ) | සීතාවක | (ආ) | රිටිගල | (ඉ) | මාතොට | (ඊ) | පුලතිසිපුර |
| (උ) | දෙවිනුවර | (ඌ) | ලංකා පටුන | (එ) | තන්තිරිමලේ | | (ලකුණු 01 x 07 = 07යි) |

ii ඉහත සඳහන් ඓතිහාසික ස්ථාන අතුරින් **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(ලකුණු 04 x 02 = 08යි)